ආණ්ඩු උදවු කළත් නොකළත් අපි නාට්‍ය කරනවා

මෙවර රාජ්‍ය නාට්‍ය සම්මාන උළෙලේ දී හොඳම නළුවා ලෙස සම්මානයට පාත්‍රවන්නේ ධර්මප්‍රිය ඩයස්. මේ ඔහු සමඟින් ඒ පිළිබඳ කරන ලද කතා බහයි

මේ සම්මානයත් එක්ක ඔබට මොනවද හිතෙන්නෙ?

සම්මානයක් ලැබෙන එක සතුටක්. ඒ සතුට හැම සම්මානයක් ලැබුණු මොහොතක දිම මා තුළ තිබුණා. අදත් ඒ සතුට මට තියෙනවා.

රාජ්‍ය තාන්ත්‍රික මට්ටමින් නාට්‍ය ක්ෂේත්‍රයට ලැබෙන අඩු සැලකිල්ල ගැන හිතද්දි ඔබ අද ලබන සතුට ඒ අන්දමින් පවත්වා ගෙන යන්නට හැකියාවක් තියෙනවද?

> **නාට්‍යකරුවො ප්‍රතිනිර්මාණය කරන්නෙ තමන්ට දැනෙන දේ තමන් විඳින දේ එහෙම නැතිව ආණ්ඩුවකට ඕනෙ දේ නෙවෙයි**

ඒක රාජ්‍ය තන්ත්‍රයේ තියෙන අර්බුදයක්. ආණ්ඩුව නාට්‍ය ක්ෂේත්‍රයේ සම්පූර්ණ බර කරට අරගෙන තියෙන බවක් පේන්න නම් නැහැ. එහෙම කරාවි කියන බලාපොරොත්තුවකුත් නෑ. එහෙම කරන ආණ්ඩුවක් කවදාවත් බිහිවෙන එකක් නැහැ. නාට්‍යකරුවෝ වෙනමම නාට්‍ය කරගෙන යනවා. නාට්‍යකරුවො ප්‍රතිනිර්මාණය කරන්නෙ තමන්ට දැනෙන දේ තමන් විඳින දේ. එහෙම නැතිව ආණ්ඩුවකට ඕනෙ දේ නෙවෙයිනෙ. ඉතින් අපි මොකටද මේවට වියදම් කරන්නෙ කියලා ආණ්ඩුව හිතනවා ඇති. මෙතනදි නිර්මාණකරුවෝ දැනගන්න ඕනෙ නිර්මාණ කරන්න. ආණ්ඩුවක් උදව් කරන්නෙ නෑ කියලා නිර්මාණකරුවො ගෙදර ඉඳලා හරියන්නෙ නෑනෙ. ආණ්ඩුව උදවු කළත් නොකළත් නිර්මාණකරුවෝ නිර්මාණ කළ යුතුයි.

ඔබ සම්මානයට පාත්‍ර වූ 'නැතුව බැරි මිනිහෙක්' නාට්‍යයේ ජයන්තගේ භූමිකාව ගැන ටිකක් කතා කරමු?

මේ නාට්‍යයේ ජයන්තගේ චරිතය පිටුපස්සෙ සම්පූර්ණයෙන්ම හිටියේ අධ්‍යක්ෂවරයා. ඔහුට තමයි මෙ සම්මානයේ ගෞරවය සියයට අසූවක්ම හිමිවෙන්න ඕනේ. එතනදි රාජිතට ඒ ගෞරවය අනිවාර්යෙන්ම ලැබෙන්න ඕනේ. සමහර වෙලාවට නළු කාර්යය ඉස්මතුවෙන අවස්ථා තියෙනවා. ඒ වගේ වෙලාවට නළුවාගෙ දායකත්වය නිසා නොහිතන චරිත මතුවෙනවා. හැබැයි මේ නාට්‍යයෙ දි අධ්‍යක්ෂවරයගෙ සිතුවිලිවලට අනුව හැමදෙයක්ම සිද්ධ වුණා. එබැවින් මගේ මේ චරිත රංගනයට යම් ඇගයීමක් ලැබුණා. නම් එහි ගෞරවය අධ්‍යක්ෂවරයාට හිමියි.

ඔබ මේ ලද මුල්ම ඇගයීම නොවෙයි. මින් පෙර ලබාගත් ඇගයීම් ගැන සිහිපත් කළොත්?

මීට කලින් මම රාජ්‍ය නාට්‍ය උළෙලේ හොඳම නළුවා බවට පත්වෙලා තියෙනවා. 2004 දි වේදිකා පසුතල නිර්මාණය සඳහා සම්මාන ලබා ගෙන තියෙනවා. බොහෝ අවස්ථාවල දි නිර්දේශිත නම් අතරට ඇවිත් තියෙනවා. 2008දි සරසවි සම්මාන ලැබුණා. ඉන්පසුව සිග්නීස් උත්තමාචාර හිමි වුණා. ඔය විදියට මතකයේ රැඳුණු සම්මාන බොහොමයක්ම මට ලැබිලා තියෙනවා.

මිනිසුන් සිනහවට කැමැතියි. ඒ නිසාම ප්‍රහසන ගණයේ නාට්‍ය බිහිවෙනවා. එවැනි නාට්‍ය නිර්මාණය කිරීම තුළ ප්‍රේක්ෂක ආකර්ෂණය වැඩිකර ගත හැකි නිසාම ද අද එවැනි නාට්‍ය බිහිවීමක් දක්නට ලැබෙන්නෙ?

ප්‍රහසන නාට්‍ය මේ කාලයේ විතරක් නම් නෙවෙයි. මං අහලා තියෙන හැම කාලයකම බිහි වුණා. එවැනි නාට්‍ය කරා ඇදෙන රසික පිරිසක් ඉන්නවා. ඒක රැල්ලක් විදිහට වර්ධනය වීමක් නම් මං දකින්නෙ නෑ. විවිධ ගණයේ නාට්‍ය බිහිවෙනවා. ඒ ඒ නාට්‍ය වෙනුවෙන්ම හැදුණු රසික පිරිසක් ඉන්නවා. නමුත් මං මෙතනදි එක දෙයක් දකිනවා. ඒ හොඳ නිර්මාණ බිහිකරන්න තරම් හොඳ රචකයො අඩුවීමක් මේ වෙනකොට දකින්නට ලැබෙනවා. මේකට හේතුව වසර ගාණක් තිස්සේ රට තුළ පැවති අධ්‍යාපන ප්‍රතිපත්ති හෝ මොනයම් ක්‍රමවේදයක අඩුපාඩුවක් විදිහට තමයි මම දකින්නෙ.

නිර්මාණකරුවන්ව මෙවැනි ඇගයීමකට පාත්‍ර කිරීම ගැන ඔබ මොකද හිතන්නෙ?

ඕනෙම රටක නිර්මාණකරණයේ නියැලෙන අයව ඇගයීම ඉතා වැදගත්.

> **රංගන කාර්‍යය වෙනුවෙන් සම්මානයක් ලැබීම උපස්ථම්භනයට හොඳ සාධනයක්**

ඉන් හොඳ උපස්ථම්භනයක් හම්බ වෙනවා. උත්තේජනයක් එනවා, තමන් නියැළෙන කාර්යයේ නැවත නැවත හොඳින් නියැළෙන්න. අපේ වගේ රටක සම්මානයක් ලැබුණා කියන එකෙන් මහා ලොකු වෙනසක් නම් වෙන්නෙ නැහැ. මට හිතෙන විදියට ඒ ඇගයීම උපස්ථම්භනයට හොඳ සාධනයක් වෙනවා. ඒ හැරෙන්න ඔහු ඉන්න තැනින් තව දුරකට පනින පිම්මක් ලෙස නම් හඳුන්වන්නට පුළුවන්කමක් නැහැ.

■ තමාරා පතිරණ

Scan with EasyScan